# දේශය
# වෙනුවෙන්
# එක්වන
# පියවරක්

පාඨලී චම්පික රණවක

පටුන


පිටුව

01. **රට ගොඩ නගමු - හෙට ගොඩ නගමු - එක්වෙමු - හදමු**..........................03

02. **කුසගිනි නිවීම:** ආහාර අර්බුදයට විසඳුම්..................................................05

03. **රෝ දුක නිවීම:** ඖෂධ හා සෞඛ්‍ය අර්බුදයට විසඳුම්...................................08

04. **දැනුම් පවස නිවීම:** අධ්‍යාපනයේ හා එම ක්ෂේත්‍රයේ අර්බුදයට විසඳුම්.....10

05. **දහන දුක නිවීම:** ඉන්ධන හා විදුලිය අර්බුදයට විසඳුම්............................12

06. **වැඩපොලේ දුක නිවීම:** කර්මාන්ත හා රැකියා අර්බුදයට විසඳුම්................14

07. **පරිපාලන දුක නිවීම:** රාජ්‍ය ආයතන සම්බන්ධ අර්බුදයට විසඳුම්...............16

08. **මහමග දුක නිවීම:** ප්‍රවාහන අර්බුදයට විසඳුම්..............................................18

09. **නාස්තියේ දුක නිවීම:** පරිපාලන හා දේශපාලන දේහය පුරා
ඔඩු දුවා ඇති නාස්තිය හා දූෂණයට විසඳුම් ..............................................20

10. **වියහියදම් දුක නිවීම:** රාජ්‍ය ආදායම් හා වියදම් අර්බුදයට විසඳුම්........22

11. **ජනදුක නිවීම:** ජනතා සුබසාධනය පිළිබඳ අර්බුදයට විසඳුම්.................24

12. **දේශපාලන දුක නිවීම:** දේශපාලන සංස්කෘතියේ අර්බුදයට විසඳුම්.........26

## රට ගොඩ ගනිමු
## හෙට ගොඩ නගමු
## එක්වෙමු
## හදමු.

**අතීතයෙන් වර්තමානයට**

මැර පාලකයන් නිසා දේශපාලන ක්ෂේත්‍රය පුරා ඔඩු දුවා ඇති දූෂණය, පවුල්වාදය, සහචරවාදය, මැරකම, අකාර්යක්ෂමභාවය හා අමනෝඥබව හේතු කොටගෙන මේ රටේ ජනතා හිස මත කඩා පාත්කොට ඇති ආලපාළු කරන ලද ආර්ථික තත්ත්වය රටම බංකොලොත්භාවයට ඇද දමා ඇත. එම තත්ත්වය ජනතාව තුළ අපේක්ෂා භංගත්වයත්, අසහනයත්, වෛරයත් උපද්දවා ඇත. දූෂිත දේශපාලකයින් කෙරෙහි ඇති අප්පිරියාවත්, නිලධාරී පැළැන්තිය කෙරෙහි යොමුවූ වෛරයත්, සමගින් සමස්ත ලාංකික සමාජයම කුඩා සංස්කෘතියක් කරා ගෙනයමින් පවතී.

උද්ගතව ඇති ව්‍යසනකාරී තත්ත්වයෙන් ගොඩඟෙන අනාගතය උදෙසා මේ රට ගොඩ නැගිය හැක්කේ, ජනතාව ඉදිරියේ තම හැකියාවත්, අවංකභාවයත්, උවමනාවත් යුක්ති යුක්තව ඔප්පු කරන්නට සමත්, ජනතාවගේ විශ්වාසය හා පිළිගැනීම නැවත දිනාගන්නට හැකි මනුෂ්‍යත්වයේ දේශපාලන සන්ධානයකට පමණි. මීළඟට එළැඹෙන මහා මැතිවරණය සහ ජනාධිපතිවරණය, එවන් සන්ධානයක් විසින් ප්‍රජාතන්ත්‍රවාදීව ජයග්‍රහණය කිරීම ඓතිහාසිකව අනිවාර්යය කෙරී ඇත.

ඔබ සියලු දෙනා මේ අපේක්ෂිත මනුෂ්‍යත්වයේ සන්ධානයේ ගෞරවනීය පාර්ශ්වකරුවන් වනු ඇති අතර, දූෂිත දේශපාලන කාටලයේ අවසානය එයින්ම සනිටුහන් වනු ඇත. අප එකිනෙකාගේ හා එකිනෙක කණ්ඩායම්වල ප්‍රතිපත්ති හා දර්ශනික ස්ථාවරයන්හි බහුවිධභාවයන්ට ගරු කරමින්,

සියල්ලන්ටම එකඟවිය හැකි 'ජනදුක වහා නිවන' සුහුරු ප්‍රායෝගිකවාදී විසඳුම් සහිත 'නිශ්චිත පොදු අවම වැඩපිළිවෙලකට' මූලික වශයෙන් එකඟ වෙමින් අපේක්ෂිත 'මනුෂ්‍යත්වයේ මහා දේශපාලන සන්ධානය' වහා ගොඩනැගිය හැකි බව අපි තරයේ විශ්වාස කරමු.

එවන් නිශ්චිත ප්‍රායෝගිකවාදී වැඩපිළිවෙලක් සඳහා වූ විදුහුරු යෝජනා මාලාවක් මේ රටේ සියලු දේශපාලන පක්ෂ, බහුජන, පුරවැසි හා වෘත්තීය සංවිධාන ඇතුළු සමස්ත රටවැසියන් වෙත මෙසේ නිහතමානීව ඉදිරිපත් කරන අතර මෙම 'මනුෂ්‍යත්වයේ සන්ධානය' සමග ශක්තිමත්ව එක්වන ලෙස ගෞරව පෙරදැරිව ආරාධනා කර සිටිමු.

මෙම යෝජිත වැඩපිළිවෙලේ ක්‍රියාමාර්ග අදියර දෙකක 02 කින් යුක්ත වන අතර, පළමු අදියර 'ජනදුක වහා නිවා රට නැවත ගොඩ ගැනීම' ඉලක්ක කරගෙන ඉදිරිපත් කරමු. එය කෙටිකාලීන සුහුරු විසඳුම් වලින් යුක්ත අතරම සියලු දෙනාගේ අදහස් වලින් පෝෂණය කරනු ලබන දිගුකාලීන විදුහුරු වැඩපිළිවෙලක පදනමද වනු ඇත.

ගොඩගත් රට ගොඩනැගීමේ ව්‍යායාමය දෙවෙනි අදියරේ දී විස්තර කෙරේ.

# කුසගිනි නිවීම

ආහාර අර්බුදයට විසඳුම්

වෙළෙඳපොළේ පවතින බඩු මිලත් එය ඉහළ යන වේගයත් කිසිවෙකුට දරා ගත නොහැකිය. සහගහන බදු මෙන්ම අනෙකුත් නිෂ්පාදන වියදම් ද අඩංගුකොට කූට අතරමැදියන්ගේ පංගුව ද සඟවා ඇතුළු කළ භාණ්ඩ හා සේවා මිළ ගණන් කුසගින්නටත් මන්ද පෝෂණය ඇතුළු රෝගීභාවයන්ටත් පාර කපා ඇත. එහා ජන කුසගිනි නිවීම හදිසි කටයුත්තක් සේ අප ඉදිරියේ තිබේ.

**පළමු අදියර**

1. දේශීය නිෂ්පාදන තත්ත්වයන් ද සැලැකිල්ලට ගෙන, අතරමැදියාට නොව පාරිභෝගික ජනයාට වාසි සහගත ලෙස අඩු මිලට ආහාර සැපයීමේ සිද්ධාන්තය මත පදනම්ව ආහාර මත පනවා ඇති සහගහන බදු ඉවත් කළ යුතුය.

2. පොදු ඇප් මෘදුකාංග හඳුන්වා දී තොග හා සිල්ලර ආහාර මිල ගණන් හා ඒවා මිලදී ගත හැකි ස්ථාන පිළිබඳව සියල්ලන් දැනුවත් කරන ඩිජිටල් ක්‍රමවේදයක් සකස් කළ යුතුය. එසේම සහල් ඇතුළු අනෙකුත් අත්‍යවශ්‍ය ආහාර තොග සැඟවීම වළක්වනු සඳහා සහ දිනපතා මත්ස්‍ය අස්වැන්න, තොග හා සිල්ලර මිල පිළිබඳ ධීවරයන් හා පාරිභෝගිකයන් යාවත්කාලීන කරන විවෘත ඩිජිටල් දත්ත වේදිකා වහාම නිර්මාණය කළ යුතුය.

3. අත්‍යවශ්‍ය ආහාර සඳහා දෛනිකව යාවත්කාලීන කරන මිල සූත්‍රයක් සහ නව ආහාර නියාමන නීති පාරිභෝගික අධිකාරිය හරහා ඩිජිටල් මාධ්‍ය මඟින් ජනගත කළ යුතුය.

4 අධික මාළු  මිලට හේතු වී ඇති ඩීසල් හා භූමිතෙල් සහනදායී මිලකට ධීවරයින් වෙත නිකුත් කළයුතුය.

5. එසේම ආහාර නිෂ්පාදනයේ හා බෙදාහැරීමේ  අධික ඉන්ධන පිරිවැය අවම කරනු වස් සැපිපෙනෙන ලෙස ඩීසල් මිල අඩු කළ යුතුය.

6. සංරක්ෂිත වනජීවීන් හැර අනෙකුත් සත්වයින්ගෙන් සිදුවන වගා හානි වළක්වාගැනීමේ බලය නීත්‍යානුකූලවම ගොවි ජනයාට පවරන අතර ඒ සඳහා අවශ්‍ය පහසුකම්ද සැලැසිය යුතුය.

7. වන අලින්ගෙන් ගොවි ජනතාවගේ වගාවන්ට සහ ජනජීවිතයට සිදුවන හානි වළක්වා ගැනීමට මෙම සතුන්ගේ සංරක්ෂිත භූමි තුළ ආහාර සහ ජලය ලැබෙන, ඔවුන්ගේ ජීවන රටාවට බාධා නොවන ප්‍රායෝගික වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය.

8. දේශීය වශයෙන් නිපදවනු ලබන ආහාර ද්‍රව්‍යවන්ගේ, වැඩිහිටියන්ගේ හා මවුවරුන්ගේ පෝෂණය ඉහළ නැංවීමට රජය විසින් සිදුකරන සමාජ සුභසාධන ක්‍රියාවලියේදී යොදා ගත යුතුය.

**දෙවන අදියර**

1. නවීන සන්නිවේදන ක්‍රම භාවිත කොට නවීන තාක්ෂණය යෙදවූ කෘෂි සේවාවක් ලබා දී කෘෂිකාර්මික කටයුතු හා අලෙවි කටයුතු වලට අදාළ නූතන දැනුම ප්‍රචලිත කිරීම මෙන්ම එම දැනුම ප්‍රායෝගිකව භාවිත කිරීමට අවශ්‍ය පහසුකම් ද  සැලසිය යුතුය.

2. ඉල්ලුම හා සැපයුම මත පදනම් වූ ආහාර භෝග වගා කිරීමේ සැලසුමක් ක්‍රියාත්මක කිරීම මගින් ගොවි ජනතාවට සාධාරණ ආදායමක් ලැබෙනවා මෙන්ම ජනතාවට ද සාධාරණ මිලකට ආහාර මිළ දී ගැනීමට හැකිවනු ඇත.

3. කෘෂි හා සත්ව නිෂ්පාදන ඒකාධිකාරය පාලනය කරනු වස් සුළු හා මධ්‍යම පරිමාණ නිෂ්පාදකයින්ට අවශ්‍ය මූල්‍ය හා තාක්ෂණික සහාය මෙන්ම වෙනත් දිරිගැන්වීම් උදෙසා කෘෂිකර්ම බැංකුවක් ස්ථාපිත කළ යුතුය.

4. එසේම හඳුනාගත් බැංකු ක්‍රමයක් මඟින් මත්ස්‍ය වගාකරුවන්ට හා ධීවරයින්ට නවීන මාළු බෝට්ටු ලබාගැනීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් ද ලබා දිය යුතුය.

5. ආහාර කල්තබා ගැනීම සඳහා රජය හා පෞද්ගලික අංශ ඒකාබද්ධ වී නවීන ගබඩා හා ශීතකරණ පහසුකම් සැලැසිය යුතුය.

6. පශු කර්මාන්තය සඳහා දේශීයව ආහාර හා අමුද්‍රව්‍ය සපයන්නන් බිහිකිරීමේ වැඩපිළිවෙලක් නිර්මාණය කළ යුතුය.

7. රට තුළම යූරියා සහ පොස්පේට් පොහොර නිෂ්පාදනයට රාජ්‍ය හා පෞද්ගලික හවුල් ව්‍යාපාති හඳුන්වා දීම කළ යුතුය.

8. කාලගුණික රටා හා පසෙහි පෝෂණ තත්ත්ව වාර්තා නිතිපතා ලබාගැනීම හා දැනුවත් කිරීම අඛණ්ඩව කළ යුතුය.

9. නිල්වලා, ගිං, කළු, කැලණි ගංගාවන් හි වාරිමාර්ග යෝජනා ක්‍රම සඳහා ප්‍රාග්ධන ආයෝජන සිදුකොට ගං වතුර මෙන්ම ජල හිඟය ද පාලනය කළ යුතුය. එසේම මහවැලි සංවර්ධනය අනෙකුත් ගංගා ද්‍රෝණි සංවර්ධනය හා ඒකාබද්ධ කළ යුතුය.

10. පෝෂණය පිළිබඳ නවීනතම දැනුම පාසල් විෂයමාලාවට ඇතුළු කළ යුතුය.

## රෝ දුක නිවීම

ඖෂධ හා සෞඛ්‍ය අර්බුදයට විසඳුම්

ජනයාගේ ජීවිත රෝගී කරන, බාල මෙන්ම ව්‍යාජ බෙහෙත් මගින් ජීවිත අනතුරේ හෙලන, වෛද්‍යවරුන් ඇතුළු පුහුණු සෞඛ්‍ය සේවකයින් විදෙස්ගත වන, සෞඛ්‍ය සේවයේ ඉහටහා ගිය දූෂණය නවත්වා ජනදුක වහාම නිවීමට පියවර ගත යුතුයි. මෙහිදී ඖෂධ මිල දැරිය හැකි මට්ටමකට ගෙන ඒමත්, නිසි ප්‍රමිතියෙන් යුතු ඖෂධ ලබා දීමත් ප්‍රමුඛව සළකා බැලිය යුතුය.

### පළමු අදියර

1. ඖෂධ හා අතිරේක ආහාර පිළිබඳ පිළිගත් ව්‍යක්තිකයින් යොදවා කරනු ලබන විධිමත් විගණනයක් මගින් අත්‍යවශ්‍ය, අතිශයින් අත්‍යවශ්‍ය, අත්‍යවශ්‍ය නොවන, හා අතිරේක අහාර වර්ග කොට ආනයන වියදම පාලනය කිරීමත්, විද්‍යාත්මක ක්‍රමයකට ඖෂධ සුලභ කිරීමත් කළ යුතුයි.

2. ඖෂධ හා පෞද්ගලික සෞඛ්‍ය සේවා ගාස්තු නියාමනය කොට එම මිල ගණන් හා ස්ථාන දැනගැනීමට ජංගම ඇප් එකක් නිර්මාණය කළ යුතුය. එසේම සියලු ඖෂධ හා සෞඛ්‍ය සේවා තොරතුරු එකම ඩිජිටල් වේදිකාවකට ගෙන ඒමෙන් වඩා පාරදෘශ්‍ය හා ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් තිහිකිරීමට හැකිවනු ඇත.

3. ඖෂධ නියාමන අධිකාරිය වහාම ස්වාධීන හා කාර්යක්ෂම කළයුතුයි.

### දෙවන අදියර

1. රට තුළ ඖෂධ හා සක්‍රිය අමුද්‍රව්‍ය නිපදවීමට පෞද්ගලික අංශය දිරිගැන්වීමද, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයන් ඇති කර ගැනීම ද කළ යුතුයි.

2. රාජ්‍ය සෞඛ්‍ය සේවාව ගුණාත්මකව දියුණු කරන අතරම සියලු ජනයා ආවරණය වන පරිදි 'ජාතික සෞඛ්‍ය රක්ෂණාවරණයක්' ක්‍රියාත්මක කළ යුතුයි.

3. සෞඛ්‍ය සේවාව සමාජ සුභසාධන ක්‍රියාවලියට ඒකාබද්ධ කළ යුතුය.

4. රෝග වළක්වා ගැනීමේ ක්‍රමවේදයන්ට ප්‍රතිපත්තිමය වශයෙන් ප්‍රමුඛතාව දිය යුතුය.

# දැනුම් පවස නිවීම

අධ්‍යාපනයේ හා එම ක්ෂේත්‍රයේ අර්බුදයට විසඳුම්

මන්දපෝෂණයෙන් පෙළෙන සිසු පරපුරක් ද, දරුවන්ට පාසල් ද්‍රව්‍ය මිලදී ගෙන දීමට අපහසු දෙමාපිය පරපුරක් ද, අතෘප්තිමත් ගුරු පරපුරක් ද මජර දේශපාලනයෙන් අද අපට ඉතිරි වී ඇත. යල්පැන ගිය අධ්‍යාපන ක්‍රමවේදයන්ගෙන් බැට කා අනාගතය ගැන කිසිදු සැළසුමක් බලාපොරොත්තුවක් නැතිව, රටේ අනාගතය භාර ගැනීමට සිටින මතු පරපුර දැනුමෙන් ප්‍රායෝගිකවාදී ආකල්පවලින් මෙන්ම මනුෂ්‍යත්වයෙන්ද පිරිපුන් කිරීමට අපි බැඳී සිටිමු.

**පළමු අදියර**

1. දේශීය නිෂ්පාදනවලින් සිසු දරුවන්ට පෝෂ්‍යදායී ආහාර වේලක් නොමිලේ ලබාදිය යුතුය.
2. රජයේ සුභසාධන වියදමින් සැලකිය යුතු කොටසක් දරුවන්ගේ අධ්‍යාපනයට අවශ්‍ය අමුද්‍රව්‍ය, පාසල් පොත් බෑග් හා අනෙකුත් උපකරණ සහන මිලට සැපයීම සඳහා වෙන්කළ යුතුය.
3. උපකාරක පන්ති හා ළදරු පාසල් නියාමනය කිරීම, එම ගුරුවරුන් විද්‍යාත්මකව පුහුණු කිරීම හා ශ්‍රේණිගත කිරීම කළ යුතුයි.
4. සියලු පාසල්වලට මූලික සනීපාරක්ෂක පහසුකම් සැලසිය යුතුය.
5. පෞද්ගලික පාසල්වල විෂය නිර්දේශයන් සේම අයකිරීම් ද නියාමනය කළ යුතුය.
6. පාසල් ප්‍රවාහනය පොදු ප්‍රවාහන සේවාවේම අංගයක් ලෙස සළකා ප්‍රතිසංවිධානය කළ යුතුය.
7. විශ්වවිද්‍යාල ප්‍රවේශය කුසලතාවන්ට 60%ක් හා දිස්ත්‍රික් පදනමට 40% ලෙස සකස් කළ යුතුය.

**දෙවන අදියර**

1. පාසල්වලට ගුරුවරුන් ලෙස ඉහළම සුදුසුකම් ඇති අය බඳවා ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී ඔවුන්ට ආකර්ෂණීය වැටුප්තල ලබා දියයුතුයි. ද්විභාෂක ගුරුවරුන් දිමනා මගින් දිරි ගැන්විය යුතුය.

2. අධ්‍යාපන ආශ්‍රිත නිපැයුම් සඳහා දේශීය නිෂ්පාදකයින් දිරිගැන්වීම කළ යුතුය.

3. පාසල් පද්ධති සහ තෝරාගත් විශ්වවිද්‍යාල පාඨමාලා සඳහා සඳහා 'ඊ පාසල් ක්‍රමය සහ ඊ විශ්වවිද්‍යාල' හඳුන්වාදීමත්, ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙන ගැනීමට හා විභාග වලට පෙනීසිටීමට දරුවන්ට අවශ්‍ය පහසුකම් ක්‍රමිකව පාසල් තුළ ව්‍යාප්ත කිරීමත් කළ යුතුය.

4. තාක්ෂණ නගර බිහිකොට ඒවා හා උසස් අධ්‍යාපන ආයතන සමග ඒකාබද්ධ කළ යුතුයි.

5. කාර්මික අධ්‍යාපනය විශ්වවිද්‍යාල අධ්‍යාපනයට සමාන්තරව පවත්වාගෙන යා යුතු අතර සෞඛ්‍ය ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා හෙද විශ්වවිද්‍යාල පාඨමාලා පණ ගැන්විය යුතුය.

6. රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය ජාත්‍යන්තර වර්ගීකරණයේ ඉහළටම ගෙන එනු වස් ඒවා පූර්ණ ලෙසම ස්වාධීන කොට දේශපාලන ඇඟිලි ගැසීම් සපුරාම නතර කළ යුතුය.

7. පාසල් තුළ ආගමික දර්ශනයන් තුළනාත්මකව හා සංසංදනාත්මකව ඉගැන්වීමට පහසුකම් සලසා දිය යුතු අතරම, රටේ ව්‍යවස්ථාපිත නීතිය, පුරවැසි වගකීම් හා අයිතිවාසිකම් ප්‍රඥප්ති ඉගැන්වීම පොදු විෂය නිර්දේශයට ඇතුළත් කළ යුතුය.

# දහන දුක නිවීම

ඉන්ධන හා විදුලිය අර්බුදයට විසඳුම්

රටක ජීවනාලිය වන්නේ එරට බලශක්තියයි. දැරිය නොහැකි විදුලි බිලක් ගෙවන ජනයා තවමත් අසන්නේ විදුලිබල මණ්ඩලය දිගටම පාඩු ලබන බවකි. ඛනිජ තෙල් පිළිබඳ කතාව ද මීට වෙනස් නැත. අධික ඉන්ධන මිල නිසාත්, අඛණ්ඩ සැපයුම ගැන ඇති අවිශ්වාසය නිසාත්, කර්මාන්තකරුවන් උකටලීව සිටින අතර විදේශ ආයෝජනයක් නම් එන්නේම නැත. අසාධාරණ අධික මිලකට විදුලිය හා ඉන්ධන ජනයාට විකුණමින් තම දූෂණය හා අකාර්යක්ෂමතාව වසන් කරගැනීමට උත්සාහ කරන්නන්ගේ යුගය අවසන් කළ යුතුව ඇත.

**පළමු අදියර**

1. මාසික පරිභෝජනය ඒකක 60ට අඩු නිවාසවලට ජල විදුලි නිෂ්පාදන වියදමට සමාන මිලකට විදුලිය ලබාදිය යුතුය.

2. ඉන්ධන ප්‍රසම්පාදනය පිළිබඳ තොරතුරු හා දත්ත විවෘත ඩිජිටල් වේදිකාවකට ගෙන විදුලි බලාගාර භාවිතය ස්වාධීන නිරීක්ෂණ ආයතනයකට පැවරිය යුතුය.

3. ඒකක 300ට වැඩියෙන් පරිභෝජනය කරන පාරිභෝගිකයින්ට ඊසි ලෙස තමන්ම විදුලිය නිෂ්පාදනය කරගැනීමට ඉඩ පහසුකම් සැලසිය යුතුය.

4. නිවෙස්වල සූර්ය පැනල භාවිතය සඳහා දිරි දීම මෙන්ම අවශ්‍ය මූල්‍ය පහසුකම් සැලසිය යුතුය.

5. සියලු ඉහළ ගණයේ පාරිභෝගිකයන්ට ඉල්ලුම පාලනය කිරීමේ කළමනාකරණ ක්‍රමවේදයන් අනිවාර්යය කළ යුතුය.

6. කර්මාන්ත සඳහා කලාපයේ අනෙකුත් රටවලට වඩා අඩුවෙන් හෝ ඊට සමාන මිලකට විදුලි බලය සැපයීමෙන් අපනයන කර්මාන්ත දිරිගැන්වීම කළ යුතුය.

7. සුළං බල පුනර්ජනනීය බලශක්ති නිපදවීමට විවෘත ටෙන්ඩර් පටිපාටි මගින් ආයෝජකයන්ට ඉඩ ප්‍රස්ථා සළසා තරගකාරී මිලකට විදුලිය ලබාගනීමට කටයුතු කළ යුතුය.

8. පාරිභෝගික අයිතීන් තහවුරු කරනු සඳහා ඉන්ධන හා විදුලි බල ජාලය මත 'මහජන උපයෝගිතා කොමිසමේ' බලතල පුළුල් කළ යුතුය.

**දෙවන අදියර**

1. රටේ ආර්ථිකයට සෘජුව බලපාන ඩීසල් ඉන්ධන මිල අවමයෙන් පවත්වා ගත යුතුය.

2. ලංවිම හා තෙල් සංස්ථාව, වෘත්තිකයන්ගේ හා වෘත්තිය මට්ටමේ කළමනාකාරීත්වයකට භාරකොට වැටුප්, උසස්වීම් ආදිය කාර්ය ඇගයීම් වලට අනුකූලව සිදුකළ යුතුය.

3. දැනට තිබෙන සූර්යය බල සම්ප්‍රේෂණ පද්ධති පුළුල් හා නවීකරණය කළ යුතුය.

4. මන්නාරම් ද්‍රෝණියේ ගෑස් නිපදවීම සඳහා ශ්‍රී ලාංකික රාජ්‍ය පුද්ගලික ඒකාබද්ධ සමාගමක් බිහිකොට, අවශ්‍ය ප්‍රාග්ධනය ලබාගැනීමට විදේශගත ශ්‍රී ලාංකිකයන් වෙත දේශප්‍රේමී බැඳුම්කර නිකුත් කළ යුතුය.

5. අඛණ්ඩ බලශක්ති සංරක්ෂණ වැඩපිළිවෙලක් සැලසුම් කොට දියත් කළ යුතුය.

# වැඩපොලේ දුක නිවීම

## කර්මාන්ත හා රැකියා අර්බුදයට විසඳුම්

ආර්ථික බංකොලොත්භාවය විසින් ලක්ෂ ගණනක් කම්කරුවන්ගේ රැකියා අහිමිකොට ඇත. ඉතිරි අයගේ රැකියා අනතුරට ආසන්නය. සමාජ දේශපාලන අස්ථාවරත්වයත්, අධික පිරිවැයත්, ඒ මැදිවාට සහගගන බදු බරත්, නිසා දහස් ගණනින් කර්මාන්ත ශාලා වැසී යමින් පවතී. අලුතින් ආයෝජකයින් සොයාගනීම සිහිනයක්ම වී ඇති සෙයකි.

### පළමු අදියර

1. අර්බුදයෙන් පීඩා විඳින කුඩා හා මධ්‍යම පරිමාණ නිෂ්පාදකයින් නගා සිටුවීම සඳහා මූලාධාර හා ණය පහසුකම් හඳුන්වාදීමත්, නව වෙළෙඳපොල අවස්ථා හඳුන්වාදීමත් කළ යුතුය.
2. එම කර්මාන්ත සඳහා සමාජ සුබසාධන ප්‍රතිලාභ, සමෘද්ධි හා වෙනත් බැංකු ක්‍රම, අලෙවිකරණ ආයතන පදනම් කරගත් වෙළෙඳපොලක් ඇති ස්වයං රැකියා ජාලයක් බිහිකළ යුතුය.
3. දැනට කරගෙන යනු ලබන කර්මාන්තවල ඵලදායීතාව ඉහල නැංවීමට උචිත ව්‍යාපෘති හඳුනා ගෙන ක්‍රියාත්මක කළ යුතුය.
4. බිඳ වැටුණු කර්මාන්ත හා සේවා මෙන්ම අහිමි වූ රැකියා සඳහාද වෙනත් විකල්ප අවස්ථා සොයා හඳුන්වා දීම කළ යුතුය.
5. සංචාරක ක්ෂේත්‍රය වර්ධනය කිරීම හා ගෙවීම් සඳහා ඩිජිටල් ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය.

### දෙවන අදියර

1. තාක්ෂණ සේවා සැපයීම රටේ ප්‍රධාන අපනයන ආදායම කර ගත යුතුය.
2. විදේශ ශ්‍රම වෙළෙඳපොල ඉලක්ක කරගත් උසස් පාඨමාලා ඇතිකිරීම,

විදෙස්ගතවූවන්ගේ ප්‍රේෂණ විධාන ඩිජිටල් ක්‍රමවේදයකට අනුව කිරීම ආරම්භ කළ යුතුය.

3. ආසියානු හා අප්‍රිකානු කලාප ඉලක්ක කරගත් නව අපනයන වෙළෙඳ පොලක් සඳහා නව කර්මාන්ත ජාලයක් බිහිකළ යුතුය.

4. ලොව පුරා ප්‍රචලිත වෙළෙඳ සන්නාමයන්ට නිපැයුම් සැපයීමට ලාංකික නිෂ්පාදකයින් දිරි ගැන්වීමද, දේශීය සන්නාම ජාත්‍යන්තරයට ගෙන යාමට බහු ජාතික සමාගම් හා කටයුතු කිරීමද දිරිගැන්විය යුතුය.

5. ග්‍රාමසේවා වසම් පදනම් කරගත් විශේෂ ආර්ථික ඒකක නිර්මාණය කිරීම ඒ තුලින් ගෘහ නිෂ්පාදන දිරිගැන්වීම, එකතුකිරීම හා බෙදාහරීම ඒ ඒ වසම් වලට අනුයුක්ත කොට ඇති රාජ්‍ය නිලධාරීන් මාර්ගයෙන් කළ යුතුය. මෙමගින් යම් පමණක ස්වයං යැපුම් ආර්ථිකයක් බිහිවීමෙන් ජනතාවට සහනයක් ලැබෙනු ඇත.

# පරිපාලන දුක නිවීම

## රාජ්‍ය ආයතන සම්බන්ධ අර්බුදයට විසඳුම්

අප රටේ රාජ්‍ය සේවය මේ වනවිට සලකනු ලබන්නේ රටට බරක් ලෙසිනි. අවම වැටුපකට, කිසිදු දිරි ගැන්වීමකින් තොරව, යල්පැන ගිය කළමනාකරණ විධිවලින් හෙම්බත් වූ රාජ්‍ය සේවකයාගෙන් නිසි සේවාවක් බලාපොරොත්තු විය නොහැකි අතර, ඔවුහු නිතැතින්ම මහජන විවේචනයට පාත්‍ර වෙති. රාජ්‍ය සේවය නැවත බල ගැන්වීමත්, නිසි කළමනාකරණ ක්‍රම මගින් එහි ඵලදායීතාව හා කාර්යක්ෂමතාව ඉහළ දැමීමත් අවශ්‍යයෙන්ම කළ යුතුය. එසේම ඔවුන්ගේ රැකියාවන් හා වටිනාකම් ආරක්ෂා කළ යුතුවාක් මෙන්ම දියුණුවේ නව අවස්ථා වෙත යොමු කිරීම ද, ස්වේච්ඡාවෙන් ඉවත්වන සේවකයන්ට සුදුසු වන්දි පිරිනැමීම ද, කළ යුතුය.

**පළමු අදියර**

1. රාජ්‍ය සේවක අවම වැටුප හා විශ්‍රාම වැටුප ජීවන වියදමට සරිලන ලෙස නැවත සකස් කළ යුතුය.
2. රාජ්‍ය ආයතන කටයුතු ඉලෙක්ට්‍රොනික වේදිකාවකට ගෙන රාජ්‍ය සේවක, විශ්‍රාමික හා මහජන තොරතුරු එමගින් විවෘත කළ යුතුය.
3. සියලු වාහන හා වෙනත් බලපත්‍ර නියමිත කාලයකට යටත්ව මාර්ගගත ක්‍රමයට ලබාදීම ආරම්භ කළ යුතුය.
4. රාජ්‍ය සේවය සඳහා බඳවා ගැනීම විෂය දැනුම, පුහුණුව හා කුසලතාව මත විවෘත පදනමකින් කළ යුතුය.
5. විශ්‍රාමික රාජ්‍ය සේවකයන්ගේ දැනුම අත්දැකීම්, පරිපාලන හා සංවර්ධන තීන්දු ගැනීමේදී ලබා ගත කළ යුතුය.
6. රාජ්‍ය සේවකයින්ගේ කාර්යයභාරය සේවා විගණනයක් කොට, කැමති අයට විශ්‍රාම ක්‍රමයක් යෝජනා කොට නිදහස් කළ යුතුය.

7. දැනට ඇති 1200ක් පමණ වූ රාජ්‍ය ආයතනවල කාර්යයන් පිළිබඳ විද්‍යාත්මක කළමනාකරණ විගණනයක් සිදුකොට, එමගින්

- වසා දැමිය යුතු
- ඒකාබද්ධ කළ යුතු
- ව්‍යුහගත කොට රජය විසින් පවත්වාගත යුතු
- රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයෙන් පවත්වාගත යුතු
- පෞද්ගලීකරණය කළ යුතු

ආයතන හඳුනා ගත යුතුය. මෙසේ කිරීමෙන් රාජ්‍ය සේවය සරල, කාර්යක්ෂම, වියදම් අඩු ආයතන බවට හැරවිය යුතුය.

**ඉදිවන අඩියර**

1. දැනට ක්‍රියාත්මක වැටුප් වර්ධක, සේවා උසස් වීම් ක්‍රමවේදයටම සේවා ඇගයුම් ක්‍රමයක් ද හඳුන්වාදීම කළ යුතුයි.

2. උපායමාර්ගික ලෙස වැදගත් රාජ්‍ය ආයතන ඇගයීම සඳහා ජාතික මට්ටමේ කාර්යසාධක ඉලක්ක ලබා දී ඒවා තුළ වෘත්තීය කළමනාකාරීත්වයක් ඇතිකළ යුතුය.

3. මහජන සේවය පිණිස රටේ පරිපාලනයේ කාර්යක්ෂමතාව පූර්ණ ඉලෙක්ට්‍රොනික රාජ්‍ය පාලනයක මට්ටමට ගෙන ඒමෙන් තත්‍යකාලීන තීරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කෙරේ.

# මහමග දුක නිවීම

## ප්‍රවාහන අර්බුදයට විසඳුම්

අධික ප්‍රවාහන ගාස්තු හා අනවශ්‍ය තදබදය නිසා මගී ජනතාව විඳින්නේ අපමණ දුකකි. මේ පීඩාවෙන් දවස පටන්ගන්නා ඔවුන්ගෙන් ආර්ථික ඵලදායීතාවක් බලාපොරොත්තු විය නොහැකිය. ඇතැම් කොටස් වල හිඟතාව මෙන්ම අධික මිල ගණන් ද, තම රැකියාවන් අනාරක්ෂිත තාවකාලික ඒවා වීම ද නිසා ප්‍රවාහන සේවා සපයන සේවකයින් සිටින්නේ අසහනයෙන් වීම බව අප තේරුම් ගත යුතුය.

**පළමු අදියර**

1. කඩවත - උතුරු අධිවේගී මාර්ගයේ අතරමග නවත්වා ඇති වැඩ වහාම නිම කිරීමට කටයුතු කළ යුතුය. අනෙකුත් යෝජිත අධිවේගී මාර්ග ඉදිකිරීම් සැලසුම් බැලිය යුත්තේ රටේ ආර්ථික තත්ත්වය යහපත් කළ පසුව ය.

2. රටේ පොදු ප්‍රවාහන පද්ධතිය ඩිජිටල්කරණය මගින් කාර්යක්ෂම කළ යුතුයි.ජී පී එස් තාක්ෂණය මගින් පාලනය වන නවීන බස් රථ සේවාවක් මගින් බස් සේවය නවීකරණය කළ යුතුය.

3. කොළඹ සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය වහාම නැවත ආරම්භ කොට නිමා කළ යුතුය.

4. මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා මුහුදු හා අභ්‍යන්තර ජල මාර්ගවල හැකියාව සොයා බලා එම සේවාවන් ආරම්භ කළ යුතුය.

5. පෞද්ගලික විදුලිබල වාහන භාවිතය දිරිගන්වා, රාත්‍රී කාලයේ බැටරි ආරෝපණය සඳහා ලාබදායී විශේෂ අය ක්‍රමයක් හඳුන්වා දිය යුතුය. අධිකව ඉන්ධන වැයවෙන සුඛෝපභෝගී රථ සඳහා අපනයන විකුණුම් වේදිකාවක් සකස් කොට, විදුලි වාහන භාවිතයට ජනතාව පෙළඹවිය යුතුය.

6. ප්‍රවාහන තදබදය අධික නගරවල මංසන්ධි රථ පාලනය ස්වයංක්‍රීය මැදිරියකට බාර කළ යුතුය.

7. නාගරික ප්‍රවාහන සේවාව දියුණු කිරීම සඳහා නවීන පහත් වේදිකාව සහිත බස් රථ එකතු කිරීම සහ තරගකාරීත්වය ඇති කිරීම.

8. මහාමාර්ග නඩත්තුව සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කිරීම.

**දෙවන අදියර**

1. කැලණිවැලි දුම්රිය ව්‍යාපෘතිය ආරම්භ කරනු ඇත.

2. බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන බිහිකොට පාසල්, කාර්යාල පොදු මගී අවශ්‍යතා සඳහා පොදු ප්‍රවාහන පහසුකම් සැලසුම් සහගතව සැපයීම කළ යුතුය.

3. පවත්නා දුම්රිය සේවය නවීකරණය කිරීම, සංඥා පද්ධති නවීකරණය, අත්‍යවශ්‍ය දුම්රිය ස්ථාන අතර නව මාර්ග ඉදිකිරීම, කළයුතු අතර, මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා රාජ්‍ය හා පෞද්ගලික සමාගම් ක්‍රමයක් ඇති කරගත යුතුය.

4. අනියම් ප්‍රවාහන සේවකයින්ට (බස් හා කුලී රථ) මගී සේවාවන් සඳහා විශේෂ පුහුණුවක් ලබා දිය යුතු අතර, ඔවුන්ගේ ගෞරවය සේම අනාගතය ද සුරැකෙන පරිදි ස්වයං අර්ථසාධක අරමුදලක් ගොඩනගා ගැනීමේ ක්‍රමවේදයක් ඇතිකළ යුතුය.

5. සමස්ත දුම්රිය පද්ධතියම විද්‍යුත්කරණය කර යටි තල පහසුකම්ද ඒ සමග නවීකරණය කර විදුලි දුම්රිය පද්ධතියට එක්කෙරෙනු ඇත.

## නාස්තියේ දුක නිවීම

පරිපාලන හා දේශපාලන දේහය පුරා ඔඩු දුවා ඇති නාස්තිය හා දූෂණයට විසඳුම්

දශක කීපයක් පුරා පැවැති මජර ගජමිතුරු හවුල් විසින් මේ රටේ වංචාව දූෂණය හා නාස්තිය කෙතරම් විපුරා ඇතිද යත්, සමාජ දේහයේ සෑම තැනකම වංචාව හා දූෂණය සාමාන්‍ය ක්‍රියාවක් වී තිබේ. වරද, වරදක් බව නොදැන කරන අඳබාල වැඩිහිටි පරපුරක් ඉන් බිහිවී සිටී. මේ නිසා සාමාන්‍ය ජනයා සූරාකෑමකට මෙන්ම අවමානයකට පත්වීම ද වංචාකාර දූෂිතයන් ආරක්ෂා වීම නිසා ජනයාගේ ආත්ම ශක්තිය ගිනි වීම ද සිදුවී තිබේ.

### පළමු අදියර

1. පූර්ණ බලැති ස්වාධීන 'ආර්ථික අපරාධ යුක්ති විනිශ්චය කොමිසමක්' කෙටිකලක් තුළ ස්ථාපිත කොට රට බංකොලොත් වීමට වගකිව යුතු සියලු දේශපාලකයින්, නිලධාරීන් ව්‍යාපාරිකයින් දඬුවමට යටත් කළ යුතුව ඇත.

2. ප්‍රසම්පාදන ස්වාධීන කොමිසම බලාත්මක හා කාර්යක්ෂම කොට ප්‍රසම්පාදන ක්‍රියාවලි විධිමත හා මාර්ගගත කළ යුතුය.

3. මහජන නියෝජිතයන්, නිලධාරීන් සඳහා ලබා දෙන රටේ ආර්ථිකයට ඔරොත්තු නොදෙන අධිසුඛෝපභෝගී වාහන හා අනෙකුත් වරප්‍රසාද නවත්වා දැමිය යුතු අතර, දැනට ලබා දී ඇති වාහන වෙන්දේසි කොට සාටත් පිළිගත හැකි හා රටට ඔරොත්තු දෙන වාහන හා සේවය කිරීමට අවශ්‍ය අනෙකුත් පහසුකම් ලබාදිය යුතුය.

### දෙවන අදියර (සමාන්තර අදියර)

1. අයථා ලෙස රට තුළත් පිටතත් සඟවා ඇති දූෂිත ධන සම්පත් ජනසතු කිරීමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන වහා වහා සකස් කොට සම්මත කරගත යුතුය.

2. කිසි ශක්‍යතා අධ්‍යයනයක්, මූල්‍ය අධ්‍යයනයක්, පරිසර අධ්‍යයනයක් සම්පූර්ණ කොට නැති කිසිදු ව්‍යාපෘතියක් අනුමත කරලීමට විධායකයට නොහැකිවන ලෙස ව්‍යවස්ථාපිත නීති ගෙන ආ යුතුය.

3. පවතින තත්ත්වයන් සැළැකිල්ලට ගෙන නව 'ජාතික භෞතික සැලැස්මක්' සකස් කොට, ඉන් පිටත කිසිදු ඉහළ ගනයේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට නොහැකි වන ලෙස නව නීති අන පණත් සම්මතකොට ක්‍රියාත්මක කළ යුතුයි.

## විය හියදම් දුක නිවීම

රාජ්‍ය ආදායම හා වියදම් අර්බුදයට විසඳුම්

රාජ්‍ය ආදායමට වඩා වියදම වැඩිවන්නේ සැබැවින්ම සුභසාධන හා සුභසාධන කටයුතු නිසාම නොවේ. නාස්තිය, දූෂණය, අකාර්යක්ෂමතාවට මුවා වූ වංචාව නිසාය. ජනතාව සූරා නොකා රාජ්‍ය ආදායම වැඩිකිරීමටත්, ජනතාව දුකට පත් නොකොට රාජ්‍ය වියදම අඩුකර ගැනීමටත්, එම අරමුදල් නැවත රට ගොඩ නැගීමට යෙදවීමටත්, අප කටයුතු කළ යුතුය.

**පළමු අදියර**

1. රාජ්‍ය ආදායම හා වියදම අතර, පරතරය අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය විගවීමේ පනතට යටත්ව පවත්වා ගත යුතුය.
2. අක්‍රමවත් මූල්‍ය වෙළෙඳපොල ග්‍රහණය කිරීම සඳහා ඇතැම් තෝරාගත් සේවා හා ගනුදෙනු වලට ඩිජිටල් ගෙවුම් ක්‍රම අනිවාර්යය කළ යුතුය.
3. රාජ්‍ය බදු ආදායම ස්ථාවර කිරීම සඳහා සෘජු බදු හා වක්‍ර බදු අනුපාතය දැන් පවතින 20: 80 න් පිළිවෙලින් 40:60 සීමාවට ගෙන ආ යුතුය.
4. බදු රැස් කරන ආයතන, බදු ආයතන හා ඒ සම්බන්ධිත සියලු ආයතන වසරක් තුළ පොදු ඉලෙක්ට්‍රොනික් වේදිකාවකට සම්බන්ධ කොට ප්‍රතිව්‍යුහගත කළ යුතුය.
5. පනත මගින් බදු ගෙවීමට සුදුසුකම් ලැබුවන් සඳහා පමණක් වසරක් තුළදී බදු ලිපිගොනු විවෘත කළ යුතුය.
6. බදු පැහැර හරින්නන් හා රාජ්‍ය බැංකුවල අක්‍රිය ණයකරුවන්ගේ තොරතුරු ප්‍රසිද්ධ කරන අතර, ඒවා අය කරගැනීමට සියලුම නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය.
7. බදු සහන ලැබූවන්ගේ නම් ලැයිස්තු ප්‍රසිද්ධ කළ යුතුය.

8. වසර තුනක් තුළ ඩිජිටල් බැංකු ක්‍රමය හා ඩිජිටල් රුපියල සහිත දෙමුහුන් මූල්‍ය වෙළෙඳපොළක් බිහිකළ යුතුය.

**දෙවන අදියර**

1. වසර තුනක් තුළ නව නීති සම්මත කොට බදු අහිමි වීම් සටහන් කොට නොගෙවා ඇති බදු අය කරගැනීමට කටයුතු කළ යුතුය.
2. රහසිගත විදේශ ගිණුම් පවත්වාගෙන යාම විමර්ශනය කොට දැඩි නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය.
3. අවඉන්වොයිස් කොට අඩු මිල ගණන් පෙන්වා භාණ්ඩ අපනයනය / ආනයනය වැළැක්වීමට පියවර ගත යුතුය. අවඉන්වොයිස් කිරීමෙන් රටට අහිමිකොට විදේශයන් හි රඳවා ගන්නා විදේශ විනිමය ලබාගැනීම පිණිස ඉලෙක්ට්‍රෝනික හා කෘත්‍රිම බුද්ධිය යොදා ගත යුතුය.
4. වරාය හා ගුවන්තොටුපොළ ආනයන අපනයන ක්‍රියාවලිය සපුරා ස්වයංක්‍රීය කළ යුතුය.
5. රාජ්‍ය දේශීය ණය සමාජ සාධාරණත්වයට ඉඩ සැලසෙන ලෙස ගැඹුරු ප්‍රතිව්‍යුහගතකරණයකට ලක් කළ යුතුය.
6. විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී ඒවායේ පොලී අනුපාත, කල් පිරෙන කාලය, ද්විතීයික වෙළෙඳපොළ වටිනාකම යන සාධක මත ණය හිමියන් සමග නැවත සාකච්ඡා ආරම්භ කළ යුතුය.

# ජනදුක නිවීම

## ජනතා සුබසාධනය පිළිබඳ අර්බුදයට විසඳුම්

රටක ජනතාව පොහොසත් කිරීමට පළමුව ජීවත් කරවීම රජයක අවම වගකීමයි. එනිසා සහනාධාර සහ සුභසාධනය ප්‍රතික්ෂේප කිරීම කිසිසේත්ම කළ නොහැකිය. වැඩිහිටියන්, දුබලයන්, දරුවන් මෙන්ම පවුවරුන් රැක ගැනීම අනිවාර්යය වගකීමකි.

**පළමු අදියර**

1. මාසික විදුලි බල පරිභෝජනය ඒකක 60ට අඩු පවුල්වලට නිශ්චිත භාණ්ඩ හා සේවාවන් ලබාගැනීම සඳහා ඩිජිටල් සහනාධාර කාඩ් පතක් ලබා දිය යුතුය. මේ පවුල් වලින් 90%, වසර පහක් තුළ මාසයකට රුපියල් ලක්ෂයක් ඉපයීමේ තත්ත්වයට ගෙන ඒමේ ඉලක්කය ව්‍යවසායකයින් බලගැන්වීමේ වැඩසටහනට ඇතුළු කළ යුතු අතර, 'ග්‍රාම සේවා වසම් පාදක කරගත් විශේෂ ආර්ථික ඒකක' හරහා අදාළ රාජ්‍ය නිලධාරීන් මෙම සම්බන්ධීකරණ කටයුතු කරනු ඇත.

2. ශක්තිමත් බුද්ධිමත් දරු පරම්පරාව සුහුරු අනාගතයක පදනම ලෙස සලකන්නෙන් සෑම අඩු ආදායම් ලාභී ගැබිනි මවකටම දරු පිළිසිඳ ගැනීමේ සිට වසර දෙකක් දක්වා මාසිකව රුපියල් 5000ක පෝෂ්‍යදායී ආහාර නොමිලේ සැපයිය යුතුය.

3. ආබාධිත පුවත් හා රැකවරණ අහිමි වියපත් වැඩිහිටියන් රජයේ වගකීමක් ලෙස සලකා ඔවුන්ගේ රැකවරණයට රාජ්‍ය මට්ටමේ මැදිහත්වීමක් කළ යුතුය.

4. දැනට ක්‍රියාත්මක සුභසාධන හා සහනාධාර ව්‍යාපෘති විගණන හා විමර්ශණ වලට යටත් කොට සුදුස්සන්ට පමණක් සුදුසු ලෙස ලබාදීමට කටයුතු කළ යුතුය.

5. රටේ සියලු ආගමික ස්ථානවලට පළමු විදුලි ඒකක 100 සහන පදනමකින්

ප්‍රදානය කිරීමට කටයුතු කළ යුතුය.

### දෙවැනි අදියර

සැබැවින්ම ජනතා සුබසාධන ක්‍රියාවලියේ දෙවැනි අදියර වන්නේ, පුරවැසියන් ලෙස ස්වාධීනව තම දෙපයින් නැගී සිටිය හැකි, කාටවත් බරක් නොවුන පුරවැසියෙකු බිහිකිරීමට කටයුතු කිරීමයි. එවිට කිසිවෙකුට යටත් නොවී, සැබෑ පුරවැසියෙකු ලෙස ගම් රටේ ආර්ථික හා සමාජ ගොඩනැංවීමට ඔවුනට සහභාගිවීමට හැකිවනු ඇත.

# දේශපාලන දූක නිවීම

දේශපාලන සංස්කෘතියේ අර්බුදයට විසඳුම්.

රටේ වර්තමාන ආර්ථික අර්බුදය හා ඒ සමග නිදු වී ඇති සමාජ පරිහානියට විශාල වශයෙන් බලපෑවේ පරිහානිගත මජර දේශපාලන සංස්කෘතිය වීම සැඟවීමට කරුණක් නොවේ. සුසාධිත දේශපාලන සංස්කෘතියක් බිහි කිරීමට අවශ්‍ය පරිසර වටපිටාව සකස් කිරීම මේ යෝජිත මනුෂ්‍යත්වයේ සන්ධානයේ එක් ප්‍රමුඛ කාර්යයකි. දූෂිතයින් දේශපාලනයෙන් ඉවත් කිරීමත්, දූෂිතයින්ට දේශපාලනයට ඇතුළු වීමට ඇති ඉඩ කඩ ඇහිරීමත්, එසේම දේශපාලන බලය තුළින් දූෂිතයන් බිහිවීම වැලැක්වීම සඳහාත්, අවශ්‍ය පූර්ව කොන්දේසි පැනවීම මෙයින් අරමුණු කෙරේ.

**පළමු අදියර**

1. වහාම අධිකරණයෙන් වැරදිකරු නොවූ පොලිස්පතිවරයෙකු පත්කිරීමේ වගකීම අදාළ කොමිසමට භාර කළ යුතුය.

2. ස්ත්‍රී දූෂණ, මිනීමැරීම්, මත්ද්‍රව්‍ය චෝදනා සහ මූල්‍ය වංචාවන්ට අධිකරණයෙන් වරදකරුවන් වී දඬුවම් ලැබූවන්ට මැතිවරණ සඳහා නාමයෝජනා ලබා නොදිය යුතුය.

3. අධිකරණයෙන් වරදකරුවන් වූ රාජ්‍ය නිලධාරීන් සේවයෙන් ඉවත් කළයුතු අතර, රාජ්‍ය සේවයට බඳවා නොගත යුතුය.

4. ජනාධිපතිවරයාගේ විධායක බලතල 2015 ඉදිරිපත් කළ යහපාලන යෝජනා මට්ටමට ගෙන ආ යුතුය.

5. ජනාධිපතිවරයාගේ සිට පහළට සියලු මහජන නියෝජිතයන් වාර්ෂික වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු අතර, පාර්ලිමේන්තුව විසින් ඒවා ප්‍රසිද්ධ කළ යුතුය.

6. එසේ කිරීමට අපොහොසත් නියෝජිතයන්ට දේශපාලන ආයතන තනතුරු කොට ලැයිස්තුවේ ඊළඟට සිටින අයට අවස්ථාව ලබා දිය යුතුය.

7. මහජන නියෝජිතයින්ගේ පෞද්ගලික කාර්යය මණ්ඩල සඳහා සැපිරිය යුතු සුදුසුකම් අනිවාර්ය කළ යුතුය.

**මෙදවන අදියර**

8. දේශපාලන පුහුණු විද්‍යායතනයක් පිහිටුවා මහජන නියෝජිතයන් පුහුණු කිරීම කළ යුතුය.

9. පාසල් මට්ටමේ සිටම දරුවන්ට සමාජ වටිනාකම් හා ප්‍රමුඛතා ඉගැන්වීම, දේශපාලන වගකීම් හා අයිතිවාසිකම් පුරවැසි යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුම හා අවබෝධය ලබා දීමට කටයුතු කළ යුතුය.

10. අමාත්‍යාංශ කටයුතු ඩිජිටල් වේදිකාවකට ගෙන එමින් තොරතුරු විවෘත කිරීම කළ යුතුය

11. උසස් තනතුරු දරන රජයේ නිලධාරීන් දේශපාලන බලපෑමෙන් ස්වාධීන කිරීම මෙන්ම, ඔවුන් වැරදි කොට දේශපාලක රැකවරණ ලැබීම වැලැක්වීමට අවශ්‍ය නීති ප්‍රතිපාදන සකස් කළ යුතුය.